දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් සමඟින් උපදේශන සේවා කරා යොමු විය හැකි හදිසි උපකාරක අංක සඳහන් කිරීමේ වැදගත්කම පිළිබඳව Ethics Eye අපි නිරතුරුවම සඳහන් කර ඇත්තෙමු.

කෙසේ නමුත්, උපදේශන සේවාවන් අවශ්‍ය වන්නේ දිවි තොර කරගැනීමේ නැඹුරුතාවකින් යුතු අයවලුන්ට පමණක් නොවේ. මත්ද්‍රව්‍ය ඇබ්බැහියෙන් පෙළෙන්නවුන් හෝ පහරදීම් වලට මුහුණ පෑ අයවලුන් (survivors) හටද වෛද්‍ය සහාය මෙන්ම උපදේශන සහාය අත්‍යාවශ්‍ය වනු ඇත. ඒ අනුව, මානසික සෞඛ්‍යයට අදාළ වන ලිපි හෝ පුවත් වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, ඉහත සඳහන් ආකාරයේ සමාජ ගැටළු වලට මුහුණ පෑ අයට උපදේශන සේවා වෙත යොමු වී සහනයක් ලබාගැනීමට ඉඩකඩ ලැබෙනු ඇති අතරම, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයවලුන්ට පවා යහපතක් සිදුවනු ඇත.

The Morning පුවත්පතේ 2011 නොවැම්බර් 23 සහ 25 දින වල මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳවත්, පහරදීම් වලට මුහුණ පෑ අයවලුන්ගේ මානසික සෞඛ්‍යය පිළිබඳවත් ලිපි දෙකක් පළවී තිබිණි. එම ලිපි සමගින්, හදිසි උපකාරක අංකද දැක්වීමට පුවත්පත සැලකිලිමත් වී තිබිණි. එය සැබවින්ම ප්‍රශංසනීය වේ. මින් පෙර අවස්ථා කිහිපයකදී ද The Morning පුවත්පත හදිසි උපකාරක අංක තම ලිපි සමගින් සඳහන් කිරීමට සැලකිලිමත් වී තිබූ බවද මෙහිදී සඳහන් කළ යුතු වේ.

එසේම, අනෙකුත් මාධ්‍යද එම ආදර්ශය අනුව යමින්, අඩු තරමින් දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් හෝ ලිපි සමගින් හෝ හදිසි උපකාරක අංක සඳහන් කිරීමට සැලකිලිමත් වනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333 *
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
**ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)